බොරලැස්ගමුව නගර සභාව

**කොළඹ දිස්ත්‍රික්කය**

**----------------------**

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 30 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 07 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට බොරලැස්ගමුව නගර සභාවේ මුල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**---------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

**------------------------**

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ මුද්දර ආදායම රු.60,440,955 ක් ගිණුම් තැබීමේදී මුදල් පදනම හා උපචිත පදනම යන දෙකම භාවිතා කිරීම නිසා මුද්දර බදු ආදායම අධි ගණනය වී තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපූර්ණය නොවූ වැටුප් රු.4,646,537 ක් 2017 ජනවාරි මස ප්‍රතිපූර්ණය වුවත් එම මුදල වැටුප් ප්‍රතිපූර්ණ ණයගැති ගිණුමට බැර නොකර ආදායම් ආධාර ගිණුමට බැර කිරීම නිසා වැටුප් ප්‍රතිපූර්ණ ණයගැති ගිණුමේ හා ආදායම් ආධාර ගිණුමේ ශේෂයන් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) දිළිදුකම පිටුදැකීමේ ව්‍යාපෘතිය යටතේ 2017 වර්ෂයේ මිලදීගත් රු.325,000 ක් වටිනා මහන මැෂින් 10 ක් ලී බඩු හා කාර්යාල උපකරණ යටතේ ගිණුම්ගත කිරීම නිසා ලී බඩු හා කාර්යාල උපකරණ ගිණුමේ ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) 1999 සිට 2014 වර්ෂය දක්වා පරිත්‍යාග හා මිලදීගැනීම් වශයෙන් ලබාගත් වාහන 05 ක වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2 ලැබිය යුතු ගිණුම්**

**--------------------**

(අ) 2011 වර්ෂයේ සිට පැවත එන බලපත්‍ර ආදායම් ශේෂය රු.56,700 ක් සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2006 වර්ෂයේ සිට පැවත එන රු.16,905 ක පෙර ගෙවුම් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2008 වර්ෂයේ ත්‍රීරෝද රථ අලුත්වැඩියාව සඳහා ලබාගත් රු.12,000 ක අත්තිකාරම් මුදල නිවැරදිව ගිණුම්ගත නොකිරීම නිසා පෙර ගෙවීම් අත්තිකාරම් යටතේ නිරවුල් නොවූ ශේෂයක් ලෙස පැවතුණි.

**1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

අසම්භාව්‍ය බැරකම් හා පෙර ගෙවුම් අත්තිකාරම් (ඉන්ධන තැන්පත්) ගිණුම් දෙකෙහි එකතුව රු. 86,850 ක්වූ ශේෂය අදාල උප ලේඛනය හා තැන්පත් කළ රිසිට් පත ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.4 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | | වටිනාකම (රු.) | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| (i) | මු.රෙ. 110 | - | හානි හා පාඩු ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ii) | මු.රෙ. 396 (ඇ) | 55,712 | නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 06 ඉක්ම වූ චෙක්පත් 03 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (iii) | මු.රෙ. 571 | 59,465 | වර්ෂ 2 ක් ඉක්මවූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (iv) | මු.රෙ. 751 සහ මහා නගර සභා හා නගර සභා ගිණුම් සංග්‍රහයේ ගබඩා බඩු සඳහා ගිණුම් පිළිබඳ උපදෙස් | - | සභාව සතු ගබඩා භාණ්ඩ සඳහා තොග පොත් පවත්වා ගෙනගොස් නොතිබූ අතර භාණ්ඩ නිකුත් කිරීම් ලේඛනගත කර නොතිබුණි. |
| (v) | මු.රෙ. 880, 881, 891(1) හා රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 වැනි අධිකාරිය | - | ඇප තැබිය යුතු නිලධාරීන් බොහෝ දෙනෙකුගෙන් ඇප තැන්පත් ලබාගෙන නොතිබූ අතර ඇප ලේඛනයක් ද පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (vi) | මු.රෙ. 1645 | - | දෛනික ධාවන සටහන්වල වෙලාව හා දුර ප්‍රමාණය සටහන් කර විධිමත්ව නඩත්තු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (vii) | මු.රෙ. 1645 (අ) | - | වාහන ලොග් සටහන් පොත්වල ටයර්, ටියුබ්, බැටරි මාරු කිරීම්, අලුත්වැඩියා හා අනතුරු පිළිබඳව සටහන්කර විධිමත්ව පවත්වාගෙන නොතිබුණි. |
| (viii) | මු.රෙ. 1646 | - | සභාවට අයත් වාහන 11 ක ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ix) | මු.රෙ. 1653 | - | සභාවට අයත් වාහන 09 ක මයිලෝමීටර් දිගු කලක සිට අක්‍රීයව පැවතුණි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | - | සභාව සතු වාහන 28 ක් සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි. |
| (ඇ) | 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.3 ඡේදය | - | කොන්ත්‍රාත් පිරිනමන අවස්ථාවේදී අදාළ ප්‍රජාපාදක සංවිධානය කොන්ත්‍රාත් 03 කට වඩා නිරත නොවිය යුතු වුවත් කොන්ත්‍රාත් පැවරීමේදී ඊට පටහැනිව කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. |
| (ඇ) | මහා නගර සභා , නගර සභා සඳහා වූ ගිණුම් සංග්‍රහය | 109,727,030 | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.67,215,767 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.28,029,078 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

----------------------

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්**

--------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තු ගත ආදායම් (රු). '000 | 2017 බිල්කළ ආදායම (රු). '000 | 2017 රැස්කළ ආදායම (රු). '000 | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (රු). '000 | 2016 ඇස්තමේන්තු ගත ආදායම (රු). '000 | 2016 බිල්කළ ආදායම (රු). '000 | 2016 රැස්කළ ආදායම (රු). '000 | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (රු). '000 |
|---|---|---|---|---|---|---|---|---|
| වරිපනම් හා බදු | 26,700 | 24,829 | 28,726 | 13,973 | 26,451 | 27,807 | 19,623 | 17,350 |
| කුලී | 1,426 | 935 | 1,017 | 254 | 1,427 | 1,571 | 1,204 | 287 |
| බලපත්‍ර ගාස්තු | 512 | 377 | 377 | - | 463 | 401 | 338 | 63 |
| වෙනත් ආදායම් | 47,027 | 2,060 | 48,058 | 276 | 36,082 | 42,585 | 41,249 | 1,336 |

**2.2.**2 වරිපනම් හා බදු
-------------------
පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා බිල් කරන ලද වරිපනම් රු.24,828,615 ක් වුවද ඉන් රු.10,326,983 ක් හෙවත් සියයට 41.59 ක් වර්ෂය තුළ අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.13,973,104 ක් වූ අතර ඉන් රු.50,000 ක් ඉක්මවූ වරිපනම් ඒකක 10 ක් සඳහා රු.722,996 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

(ඇ) අයකරගත නොහැකි වරිපනම් බදු ශේෂය වූ රු.193,407 ක් කපා හැරීම සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී නොතිබුණි.

(ඈ) 2016 දෙසැම්බර් 31 දිනට වරිපනම් ශේෂය රු.17,349,832 ක් වුවද ඉන් සමාලෝචිත වර්ෂය තුළදී රු.16,918,396 ක් පමණක් අයකරගෙන තිබූ බැවින් රු.431,436 ක් හිඟව තිබුණි.

**2.2.**3 කුලී
------

(අ) සමාලෝචිත වර්ෂය සඳහා බිල්කල කඩකුලී ආදායම රු.935,100 ක් වුවද ඉන් රු.799,763 ක් හෙවත් සියයට 85.5 ක් පමණක් වර්ෂය තුළ අයකරගෙන තිබුණි.

(ආ) සභාවට අයත් කඩ කාමර 26 කින් රු.189,064 ක බදු කුලී සමාලෝචිත වර්ෂයේදී අයකරගෙන නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයේ මුද්‍රා තැබූ කඩ කාමර 02 ක හිඟ කුලිය රු.76,292 ක් අයකල නොහැකි වී තිබුණු අතර එම කඩ කාමර නැවත ටෙන්ඩර් කර බදු දීමට කටයුතු නොකිරීම නිසා ලබාගත හැකිව තිබූ ආදායමක් අහිමි වී තිබුණි.

(ඈ) 2017 ජනවාරි 01 දිනට හිඟ කඩකුලී ශේෂය රු.287,328 ක් වුවද ඉන් රු.104,399 ක් සමාලෝචිත වර්ෂය තුළදීද අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

**2.2.4** බලපත්‍ර ගාස්තු

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව ව්‍යාපාරික ස්ථාන 157 කින් රු.197,800 ක ව්‍යාපාර හා කර්මාන්ත බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 සිට 2015 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාල රු.36,000 ක හිඟ ව්‍යාපාර බදු සමාලෝචිත වර්ෂය තුළද අයකර ගෙන නොතිබුණි.

**2.2.5** මුද්දර ගාස්තු

(අ) සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත මුද්දර ආදායම රු.30,000,000 ක් වුවද වර්ෂයට අදාළව මුදලින් ලැබීම් නොතිබුණි.

(ආ) 2017 ඔක්තෝබර් 24 දිනැති ලිපියේ ඇතුලත් අඩුපාඩු පිළිබඳ පරික්ෂා කර කොළඹ ඉඩම් රෙජිස්ටාර් කාර්යාලයෙන් ලැබිය යුතු රු.3,655,100 ක මුද්දර ආදායම ලබාගැනීමට කටයුතු නොකිරීම නිසා එම ආදායම සභාවට අහිමි වී තිබුණි.

**3** මෙහෙයුම් සමාලෝචනය

**3.1** කාර්යසාධනය

(අ) ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී මාර්ග කාපට් කිරීම හා අතුරු මාර්ග සංවර්ධන කිරීම වෙනුවෙන් එකම අයිතම සඳහා යොදාගත් රේටයන් අතර වෙනස්කම් නිරීක්ෂණය විය.

(ආ) මාර්ග ඉදිකිරීම හා කාණු පද්ධති ඉදිකිරීම් සඳහා ඇස්තමේන්තු සැකසීමේදී ගොඩනැගිලි ගාස්තු උපලේඛනයේ (BSR) සහ මාර්ග ගාස්තු උපලේඛනයේ (HSR) රේට්වල යොමු සටහන් කර නොතිබුණි.

(ඇ) සභා අරමුදලින් ක්‍රියාත්මක කළ යුතු රු.12,048,526 ක් වටිනා ව්‍යාපෘති 14 ක් 2017 දෙසැම්බර් 31 දින වන විට නිමකර භාරදිය යුතු වුවත් කාලපමාවකින් පසුව වැඩ ආරම්භ කර තිබුණි.

(ඈ) සභා අරමුදලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 21 න් ව්‍යාපෘති 06 ක වැඩ 2018 අප්‍රේල් 20 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

**3.2** කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) 2017 වර්ෂය තුළ වෙන් කරන ලද කසළ ටොන් 493.62 ක් හා වෙන් නොකරන ලද මිශ්‍ර අපද්‍රව්‍ය ටොන් 9,653.27 ක් කරදියාන කසළ අංගනයට භාර දී තිබුණු අතර වෙන් කරන ලද කසළ ප්‍රමාණය වෙන් නොකරන ලද කසළ ප්‍රමාණයෙන් සියයට 5.1 ක් විය.

(ආ) කසළ වෙන්කිරීම ප්‍රශස්ත මට්ටමක නොතිබුණු අතර කසළ එකතු කිරීම නිසි පරිදි කළමනාකරණය නොකිරීම නිසා රු.7,239,952 ක් වැඩිපුර ගෙවීමට සභාවට සිදුව තිබුණි.

(ඇ) කසළ බැහැර කිරීමේ වැඩසටහන සඳහා රු.150,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද රු.79,490 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

2017 දෙසැම්බර් 31 දිනට සභාවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| i. ජ්‍යෙෂ්ඨ මට්ටම | 03 | 01 | 02 | - |
| ii. තෘතියික මට්ටම | 01 | 01 | - | - |
| iii. ද්විතියික මට්ටම | 34 | 30 | 04 | - |
| iv. ප්‍රාථමික මට්ටම | 111 | 106 | 05 | - |
| v. වෙනත් | | | | - |
| -අරුණ උදාන | 03 | 02 | 01 | - |
| -ආදේශක කම්කරු | - | 02 | - | 02 |
| එකතුව | 152 | 142 | 12 | 02 |

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 12 ක් පිරවීමට ආයතනය අපොහොසත් වී තිබුණි. එමෙන්ම ආදේශක කම්කරු තනතුරු 02 ක් අතිරික්තව පැවතුණි.

(ආ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 02 ක පුරප්පාඩු පැවතීම හේතුවෙන් සභාවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට හිඟ සේවක ණය ශේෂය රු.12,535,231 ක් වුවද ඉන් 2009 සිට 2016 දක්වා කාලපරිච්ඡේදයට අදාලව සේවකයන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු රු.113,891 ක ණය ශේෂය අයකරගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ඈ) 2009 සිට 2017 දක්වා කාලපරිච්ඡේදය තුළ ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 06 දෙනෙකුට ලබාදුන් රු.349,923 ක ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) වීඑී පහන් පැමිණිලි ලේඛනය යවත්කාලීන කර නොතිබුණු බැවින් පැමිණිලි පිළිබඳව පසුවිපරම් කටයුතුවල ඵලදායිතාවය පරික්ෂා කළ නොහැකි විය.

(ආ) දේපල වර්ෂ 5 කට වරක් තක්සේරු කර වරිපනම් බදු අයකල යුතු වුවද 2009 වර්ෂයෙන් පසු දේපල තක්සේරු කර නොතිබුණු බැවින් නව තක්සේරු ප්‍රතිශෝධනයක් සිදුකිරීමේ අවශ්‍යතාවය කෙරෙහි සභාව අවධානය යොමු කර නොතිබුණි.

(ඇ) පොදු වෙළඳපල කඩ කාමර අංක 23 හි ව්‍යාපාරික කටයුතු සිදු කළද 2014 සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට බිල්කිරීම් කර ආදායම් එකතු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

-----------------------------

**3.5.1 පවරා නොගත් වත්කම්**

-------------------------

රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යාංශය විසින් 2015 වර්ෂයේ දී සභාව වෙත ලබා දී තිබූ රු.3,232,282 ක් වටිනා කෲ කැබ් රථය, රු.24,928,666 ක් වටිනා මෝටර් ග්‍රේඩරය, රු.17,649,179 ක් වටිනා බැකෝ යන්ත්‍රය හා රු.7,967,144 වටිනා වයිබ්‍රේට් රෝල සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.5.2 නිශ්ක්‍රිය/ ඌන උපයෝජිත වත්කම්

--------------------------------------

දීර්ඝ කාලයක සිට ගර්හිත තත්වයේ පවතින වාහන දෙකක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.5.3 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

-------------------------------

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.654,438 ක් වූ කල්පවත්නා භාණ්ඩ තොගය ඇතුළත් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

-----------------------------------------

**4.1 අයවැය පාලනය**

-------------------

(අ) වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම්වල සියයට 2.98 සිට සියයට 812.11 දක්වා විචලනයන් පැවති අවස්ථා 16 ක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා වැය විෂයයන් 31 ක් සඳහා වෙන්කර තිබූ රු.8,546,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ඇ) **අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු වැය විෂයයන් 16 ක ඉතිරිය ප්‍රතිපාදනයෙන් සියයට 37 සිට සියයට 98 දක්වා පරාසයක් ගෙන තිබුණ**

**4.2 අභ්‍යන්තර විගණනය**

------------------------

අභ්‍යාන්තර විගණන අංශයේ කටයුතු විධිමත්ව සංවිධානය කර නොතිබූ අතර අභ්‍යාන්තර විගණන වාර්තාවල පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු**

-------------------------------------

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2009 ජුනි 09 දිනැති හා අංක DMA/2009(1) දරන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් කාර්තුවකට වරක් පැවැත්විය යුතු වුවත් 2017 වර්ෂය සඳහා රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

## 5 පද්ධති හා පාලනය

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
| --- | --- | --- |
| (අ) | ගිණුම්කරණය | i. ගිණුම්වලින් අත්හැරීම් තිබීම.<br>ii. ගිණුම්වල අඩුවෙන් හා වැඩියෙන් දැක්වීම් තිබීම. |
| (ආ) | ආදායම් පරිපාලනය | i. හිඟ ආදායම් අය කර නොගැනීම.<br>ii. බදු තක්සේරු කිරීම නිසි කලට සිදු නොකිරීම. |
| (ඇ) | කොන්ත්‍රාත් පාලනය | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කර නොතිබීම. |
| (ඈ) | අයවැය පාලනය | i. ආදායම් ඇස්තමේන්තු තාත්වික බවකින් යුතුව පිළියෙළ නොකිරීම.<br>ii. ආදායම් වියදම් විෂයයන්වල විශාල වශයෙන් විචලනයන් තිබීම. |
| (ඉ) | ණයගැති, ණයහිමි පාලනය | ශේෂයන් නිරවුල් නොකිරීම. |
| (ඊ) | සේවක ණය කළමනාකරණය | ණය ශේෂයන් ක්‍රමාණුකූලව අය නොවීම. |
| (උ) | තොග පාලනය | තොග ලෙජරය යවත්කාලීන කර නොතිබීම |
| (ඌ) | ස්ථාවර වත්කම් පරිපාලනය | i. වත්කම් නිශ්ක්‍රීයව පැවතීම.<br>ii. ස්ථාවර වත්කම් ගිණුම්ගත කර නොමැතිවීම. |